# මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීම් වාර්තාව

2025.08.04 වන දින ප.ව. 01.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභා රැස්වීමේදී ගරු සභාපතිතුමා විසින් කාරකසභා සාමාජිකයන් පිළිගැනීමෙන් අනතුරුව කාරකසභා අනුමැතිය ලබාගැනීම සඳහා විෂයභාර නිලධාරීන්, බාහිර ආයතන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කල ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම ගෙවීම් වවුචර්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරකසභාව විසින් ලබාගත් තීරණ පහත පරිදි වේ.

## තීරණ අංක :- 01

සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද මාර්ග මෝටර්ග්‍රේඩර් කිරීමට අදාල ගෙවීම් වවුචර්පත් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| අනු අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 01 | බුද්ධික මහතාගේ නිවස අසල මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම වෙනුවෙන් ගෙවීම - පී.ජී.ප්‍රසාද් සෙනරත්න | 42600.00 |
| 02 | ගල්කන්ද ආයුවන්දම අසපුව මාර්ගය හා එහි අතුරු මාර්ගය මෝටර්ග්‍රෙඩර් කිරීම වෙනුවෙන් ගෙවීම - පී.ජී.ප්‍රසාද් සෙනරත්න | 123000.00 |
| 03 | විල්ගම්දෙමටව වැව සිට කිරිමැටියාව මාර්ගය මෝටර්ග්‍රේඩර් කිරීම වෙනුවෙන් ගෙවීම - පී.ජී.ප්‍රසාද් සෙනරත්න | 47400.00 |
| | | 213000.00 |

සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ගෙවීම් වවුචර්පත් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| අනු අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 1 | කුරුණෑගල ප්‍රාදේශිය සභාවේ ගබඩාව සඳහා ටෝනර් සැපයිම වෙනුවෙන් ගෙවීම - HEMAX COMPUTERS | 58,400.00 |
| 2 | 2025.07.29 මුදල් කමිටුව සහ ඩෙංගු වැඩ සටහන සඳහා ආහාර සැපයීම - SINGHE BAKERS | 20,850.00 |
| 3 | වීදි පහන් සඳහා විදුලි උපාංග සැපයිම වෙනුවෙන් ගෙවීම - OCEAN ELECTRICALS | 202,000.00 |
| 4 | වීදි පහන් සඳහා බල්බ සැපයිම වෙනුවෙන් ගෙවීම - SUGATH ELECTRICALS | 1,068,000.00 |
| 5 | ප්‍රධාන කාර්යාලයේ කමිටු හා රැස්වීම් සඳහා තේ සැපයීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම - සමුපකාරය | 13,410.00 |
| 6 | VIP ටෙන්ට් වල අඩුපාඩු සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - PREMO INDUSTRIES (සුළු මුදල්) | 3,800.00 |
| 7 | කුරුණෑගල ප්‍රාදේශිය සභාවේ ගබඩාව සඳහා 500ML ජල බෝතල් සැපයීම වෙනුවෙන් ගෙවීම - COLD BEVERAGES | 4,400.00 |
| 8 | පිල්ලව අබලන් මාර්ගය සංවර්ධනය සඳහා ABC කියුබ් 02ක් සැපයීම වෙනුවෙන් ගෙවීම - UPALI CONSTRUCTION | 21,000.00 |
| 9 | කුරුණෑගල ප්‍රාදේශිය සභාවේ ගබඩාව සඳහා ටෝනර් ඉන්ක් සැපයීම වෙනුවෙන් ගෙවීම -OFFICE IT | 143,488.00 |
| 10 | වැවගෙදර ළමා උද්‍යානය සඳහා වතුර බට සැපයීම වෙනුවෙන් ගෙවීම - STC | 11,640.00 |
| 11 | හියුම් පයිප්ප සැපයීම වෙනුවෙන් ගෙවීම - SPS SEEVALI | 474,225.00 |
| | | |
| | | **2,021,213.00** |
| 2025.07.16 දින පැවති දියබාව ආදාහනාගාරයේ විදුලි අළුත් වැඩියාව සඳහා වන තාක්ෂණික ඇගයීම් වාර්ථාව | | |

## තීරණ අංක : - 02

2025 ජුලි මාසයට අදාල ආපදා ණය ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් විෂය භාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල ඉල්ලුම්කරුවන් වෙත ආපදා ණය ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදී.

- පී.කොලින්ටන් මයා - රු.400,000.00
- ආර්.පී.එස්.බුද්ධික මයා - රු.400,000.00
- එස්.ඒ.එස්.වික්‍රමතිලක මයා - රු.400,000.00.
- කේ.එස්.පී.කරුණාසිංහ මිය - රු.400,000.00
- එම්.පී.ඒ.අනුරුද්ධ මයා - රු.400,000.00
- එස්.පී.එම්.ආරියවංශ මිය - රු.400,000.00

## තීරණ අංක : – 03

පහළගම, සියඹලන්ගමුව ග්‍රාම නිලධාරි වසමේ රුක්ගොල්ල මූකලාන නමැති ඉඩමෙහි බොරළු කපා සියඹලන්ගමුව පහගම සිට ගල්කන්ද හරහා රත්කරව්ව ප්‍රධාන මාර්ගය දක්වා බොරළු ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඊට අදාල ඇප තැන්පතු මුදල අයකර ප්‍රවාහන අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 04

ධනුෂ්ක ජීවන්ත දහම්පත් යන අය විසින් උඩකොටුව, රත්කරව්ව බොරළු කපන ඉඩමේ සිට සියඹලන්ගමුව හංදිය දක්වා බොරළු ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම් ගත වී ඇති මාස 03 ක කාල සීමාව 2025.06.05 දිනෙන් අවසන් වීම නිසා එම ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 05

රඹුක්කන කටුපිටිය මාර්ගයේ නැලව බෝගමුව ප්‍රාදේශීය සභාවට අයත් කාපට් අතුරා සංවර්ධනය කරන ලද මාර්ගයෙහි මීටර් 180ක පමණ දුරක් සඳහා කියුබ් 03 ටිපර් රථ මඟින් බොරළු ප්‍රවාහනය කිරීම සඳහා අවසර ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර එහිදී, ප්‍රාදේශීය සභාව විසින් කියුබ් 02 බර පන්තියේ වාහන සඳහා පමණක් අනුමැතිය ලබා දෙන බවත් කියුබ් 03 සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 06

හෙරිටේජ් ප්‍රොරෙක්ෂන් සහ ඉම්පැක්ට් ඇසෙස්මන්ට් කම්පනි පුද්. සමාගම විසින් මෙකර්වත්ත සිට මොරගොල්ල බස් නැවතුම දක්වා ඇති ප්‍රාදේශීය සභා මාර්ගයෙහි කියුබ් 03 බර පන්තියට අයත් ටිපර් රථ මඟින් බොරළු ප්‍රවාහනය සඳහා අවසර ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය විෂය භාර නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් කාරක සභාවේ සාකච්ඡා කළ පරිදි කියුබ් 02 බර පන්තියේ වාහන සඳහා පමණක් ප්‍රාදේශීය සභාව මඟින් අනුමැතිය ලබා දෙන බවත් කියුබ් 03 බර පන්තියේ වාහන සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : - 07

විෂයභාර නිලධාරි විසින් වෙලේ නිවස, ඔග්ගමුව, මාස්පොත යන ලිපිනයෙහි ඒ.ඒ.ඩබ්.එස්.කේ.අමරසිංහ මහතා විසින් ගෝවාකොටුව ගොඩයාය වත්ත අතුරු මාර්ගයේ හේරත් මහතාගේ ඉඩම ආරම්භයේ සිට අවසානය දක්වා මීටර් 30 ක් දුර බොරළු ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාව සමඟ මාස 03 ක කාලය සඳහා ගිවිසුම් ගත වී ඇති අතර එම කාලය 2025.07.24 දිනෙන් අවසන් වීමට නියමිත බැවින් කාලය දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එහි දැක්වෙන පරිදි කාලය දීර්ඝ කිරීමක් සිදු කිරීම සඳහා වලංගු කාල සීමාව ඉකුත්වීමට දින 30කට පෙර අළුත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත ඉල්ලුම් කළ යුතු වුවද අදාල තැනැත්තා එම කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ නමුදු ප්‍රදේශ භාර තාක්ෂණ නිලධාරි විසින් මෙම මාර්ගය නඩත්තු කටයුතු සිදු කරමින් බොරළු ප්‍රවාහනය සිදු කරන බව නිරීක්ෂනය වී තිබූ හෙයින් මෙම ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට සුදුසු බවට නිර්දේශ ලබා දී ඇති බැවින් ඒ සියල්ල කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව මෙම ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : - 08

පොදු සම්පත් සුරැකීමේ කමිටුව විසින් ගල්කඩේ හන්දියේ සිට මීටර් 300 ක් පමණ ගිය තැන එච්. එම්. එන්. එස්. බණ්ඩාර යන අය විසින් ගල්කඩේ හන්දියෙන් කුරුණෑගල රඹුක්කන මාර්ගය ඔස්සේ කියුබ් 03 බර වාහන යොදාගනිමින් බොරළු ප්‍රවාහනය කිරීම නිසා මාර්ගයේ එම කොටසට හානි වී ඇති බවත්, මෙලෙස පස් කැපීම නිසා ජල මූලාශ්‍ර සිඳී යාම වැනි පාරිසරික ගැටළු ඇති විය හැකි බවත් දන්වා ප්‍රාදේශීය සභාව වෙත පිටපතක් මඟින් යොමුකර ඇති ලිපිය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ සම්බන්ධව තාක්ෂණික නිලධාරිතුමියගේ නිර්දේශයට අනුව මාස 03 ක ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවටත්, මේ පිළිබඳව පළාත් පරිසර අධිකාරිය වෙත ලිපියකින් දන්වා යැවීමට කටයුතු කිරීම සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : - 09

ජේ. ඒ. මංජුල ප්‍රභාත් මහතා විසින් සාරගම වැව ආසන්නයෙන් වෙළඳ කුටියක් ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් මේ වන විට සාරගම සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට නියමිත බැවින් මෙම අවස්ථාවේ මෙය ලබා දීමට නොහැකි බවත්, පසුවට මේ සම්බන්ධයෙන් විධිමත්ව සොයා බලා අවස්ථාවක් ලබා දීමට කටයුතු කරන බවට ලිඛිතව දන්වා යැවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 10

සැලසුම් අංශය සඳහා කබඩ් සවි කර ගැනීම සම්බන්ධයෙන් විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ සඳහා මිල ගණන් කැඳවා අවශ්‍ය කටයුතු සලසා දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 11

2025 සාහිත්‍ය හා කියවීමේ මාසය සම්බන්ධව වැඩසටහනක් පැවැත්වීම හා ඒ සඳහා වැය දැරීමට අපේක්ෂිත රු. 267,250.00 ක ඇස්තමේන්තු මුදල අනුමත කර ගැනීම සඳහා විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමට සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 12

2025.08.15 වන දින වත්තේගෙදර කොට්ඨාසයේ ජංගම සේවා වැඩසටහන පැවැත්වීම සම්බන්ධව විෂය භාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමටත්, වැය දැරීමට අපේක්ෂිත රු. 26,040.00 ක ඇස්තමේන්තු මුදල අනුමත කිරීම සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 13

ග්‍රීන් වේ ලෑන්ඩ් පුද්ගලික සමාගම මඟින් පිඹුරු අංක 7424 දරන වට මැනුම් පිඹුරුපත අනුමැතිය සඳහා සැලසුම් කමිටුව වෙත යොමු කර ඇති අතර අක්කර 5 රූඩ් 2 පර්චස් 3.4 ක් වන මෙම ඉඩම සඳහා 2025.05.17 වන දිනැති සැලසුම් කමිටුව විසින් අනුමැතිය සඳහා නිර්දේශ කර ඇති අතර මෙය විෂයභාර නිලධාරි විසින් මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම වට මැනුම් පිඹුරුපත අනුමත කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 14

චෙක්පත්වල දෙවනි අත්සන යෙදීම සම්බන්ධයෙන් ගිණුම් අංශ විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එහි සඳහන් පරිදි ඒ සඳහා ජ්‍යේෂ්ඨ නිලධාරිනියක වන සංවර්ධන නිලධාරි එස්. එල්. ඒ. එස්. මල්කාන්ති මිය යෙදවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි

## තීරණ අංක :- 15

වීථි පහන් සවි කිරීමේ කටයුතු සඳහා දෙපට වයර් සැපයීමේ මිල ගණන් සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ සඳහා ඉදිරිපත් වී ඇති දෙවන ගැණුම්කරුගෙන් (ගෝල්ඩන් ඉලෙක්ට්‍රිකල්ස්) මිලදී ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 16

ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එච්. එම්. මහින්ද ජයලත් මහතා විසින් ප්‍රාදේශීය සභාව වෙත දන්වා ඇති ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සඳහා කමිටුවක් පත් කරන ලද අතර ඉන්පසු එම කමිටුවේ නිර්දේශ අනුව ක්‍රියා කිරීමට සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කල අතර, මේ සඳහා කොන්දේසියක් වශයෙන් වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබා ගත යුතු බවට යෝජනා විය.

## තීරණ අංක :- 17

ගොවිසෙවන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අත්කරගත් ඉඩම රජයේ ආයතනවලට වෙන්කර දීම යටතේ මැහිඇල්ල සතිපොල භූමිය සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් කාරක සභාවට යොමු කිරීමෙන් පසු, මීට අදාල භූමිය දීර්ඝ කාලීනව ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙසත්, ඒ වනතුරු භුක්තිය භාරගෙන ඉතිරි වැඩකටයුතු සිදු කිරීම සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 18

වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදි කිරීම 3 වන අදියරයේ තුන්වන බිල්පත ගෙවීම හා වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදි කිරීම 3 වන අදියරේ තුන්වන බිල්පත පරීක්ෂා කිරීම හා වැඩ අධීක්ෂණය වෙනුවෙන් ඉංජිනේරු දීමනාව ගෙවීමට අදාලව ගෙවීම් වවුචර්පත විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් කාරක සභා සාමාජිකයන් විසින් සාකච්ඡා කිරීමෙන් පසු උපදේශක ඉංජිනේරු (පළාත් පාලන) හා පළාත් පාලන ඉංජිනේරුවරුන්ගේ නිර්දේශයට යටත්ව මෙම වවුචරයේ ගෙවීම සඳහා පමණක් කමිටු සාමාජිකයන් විසින් අත්සන් තබන අතර මෙයට පෙර ඉදිකිරීම්, ටෙන්ඩර් හා ගෙවීම් සම්බන්ධව කිසිදු වගකීමක් වර්තමාන මහජන නියෝජිතයන් විසින් නොදරන බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

එකී තීරණයට අනුව, පළාත් පාලන ඉංජිනේරුවරයාගේ අනුමැතිය සහිත බිල්පතට අනුකූලව තුන්වන ඉදිකිරීම් කොටසට අදාලව අවසන් බිල්පත පහත පරිදි ගෙවීම් සඳහා නිර්දේශ කරන බවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව විසින් තීරණය කරන ලදි.

I. මූලික විමර්ශනයක් සිදු කිරීම -

ඇතුලත් විය යුතු නිලධාරින් :- අභ්‍යන්තර විගණන නිලධාරිවරයෙකු, පළාත් පාලන මූලික විමර්ශන නිලධාරියෙකු හා ජාතික විගණන කාර්යාලයේ නිලධාරිවරයෙකු (අනිවාර්යයෙන්) යටතේ

මෙම මූලික විමර්ශනයක් සිදු කිරීමට හේතුව - ශක්‍යතා අධ්‍යනයකට පරිබාහිරව සිදුකල මෙම ඉදිකිරීම සම්බන්ධව මු. රෙ. 103 යටතේ කඩිනම් පරීක්ෂණයක් සිදු කිරීම.

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබදව විස්තරාත්මක වාර්තාවට අනුව, 3.6.1 - කොන්ත්‍රාත් පරිපාලනය - ඊ - වැල්ලව සාප්පු සංකීර්ණය

II. ඉදිරියේදී කිසියම් වූ ඉදිකිරිමක් සඳහා සිදුකරනු ලබන සියළුම ගෙවීම් ඉහත සඳහන් කමිටු වාර්තාවෙන් පසුව ගෙවීමේ කොන්දේසිය මත සිදු කිරීම සුදුසු බවටත්, මහසභාවට තීරණය දැන්විය යුතු බවටත්, කඩිනමින් අදාල ආයතන වෙත මේ සම්බන්ධව දැනුවත් කිරීම කල යුතු බවටත් මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව විසින් තීරණය කරන ලදි.

................................

සකස් කලේ,

සංවර්ධන නිලධාරි,

එස්. පී. ඩී. ආර්. සමරවීර.

..............................

අනුමත කලේ,

සභාපති,

කුරුණෑගල ප්‍රාදේශීය සභාව.